# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව - 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව කටයුතු කර නොමැති අවස්ථා:

(i) පිරිවැය රු 4,198,331 ක් වු ලී බඩු හා සවි කිරීම්, පිරිවැය රු1,236,497 ක්වු පරිගණක උපාංග, පිරිවැය රු28,513 ක් වු කාර්යාල උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) පිරිවැය රු.73,625 ක් වු කාර්යාල උපකරණ පිරිවැය ඉක්මවා රු.12,269 කින් ක්ෂය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව, මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතෙහි, අසම්භාව්‍යන් හෙලිදරව් කළ යුතු බව දක්වා තිබුණද, සංස්ථාව විසින් දිගුකාලයක සිට ලැබිය යුතුව තිබුණු රු 67,154,145 ක් වූ භාණ්ඩාගාර තැන්පතු පොලිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයෙහි අනාවරණය කර නොතිබුණි.

### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දින වන විට ගිණුම් අනුව අපනයන බිල් මත ගෙවන ලද අත්තිකාරම් ශේෂය රු.34,958,636 ක් වූ අතර, එම අත්තිකාරම් වර්ෂ 05 සිට වර්ෂ 09 දක්වා වූ කාල පරාසයක නොපියවූ අත්තිකාරම් විය. කෙසේ වෙතත් මෙම මුළු මුදල සඳහා බොල් ණය ප්‍රතිපාදන සළසා තිබුණි.

(ආ) විලාසිතා නිවස සඳහා වන්දි මුදලක් ගෙවන බව තිඹිරිගසයාය ප්‍රාදේශීය ලේකම් 2010 අගෝස්තු 10 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණත්, විගණිත දිනය දක්වා එය ලැබී නොතිබූ අතර, විලාසිතා නිවසේ රු.208,973,030 ක වූ පිරිවැය ලැබිය යුතු ඉඩම් ආයෝජනයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය | සංස්ථාවේ මුදල් බාහිර ආයතනවල ආයෝජනය කිරීමේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය නොමැතිව 2011 වර්ෂය තුල රු 805,824,872 ක මුදලක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) 2005 දෙසැම්බර් 19 දිනැති අංක පීඊඩී 33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අතිරික්ත මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය කළ යුතු වුවත් ඊට පටහැනිව රු.9,000,000 ක් පෞද්ගලික බැංකුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 වගන්තිය | උපයන විට බදු අදාල සේවකයින් විසින් ගෙවිය යුතු වුවත් රු.560,432 ක් සංස්ථා අරමුදලින් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | |
| (i) | 3.5 ඡේදය සහ ප්‍රසම්පාදන කාර්‍ය සංග්‍රහයේ 2.14.1 ඡේදයට අදාල 2008 අප්‍රේල් 11 දිනැති අංක 16 දරණ සංශෝධනය | කොන්දේසිවලට පටහැනිව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කරමින් භාණ්ඩ මිලදී ගෙන තිබුණි. |
| (ii) | 5.4.4 ඡේදය | කොන්දේසිවලට පටහැනිව අවස්ථා 10 කදී 30% ත් 100% ත් අතර ප්‍රමාණයන්ගෙන් අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (iii) | 4.3 ඡේදය | කාර්යාල පරිශ්‍රය අලුත්වැඩියාවට රු මිලියන 2.5 ක මුදලක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු නමත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙළ කර නොතිබුණ. |

### 1.2.4 ද්‍රව්‍ය අක්‍රමිකතා / අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2011 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, භෞතිකව නොතිබුණ ස්ථාවර වත්කම් වල වටිනාකම රු.398,438 ක් විය. මෙම වත්කම් වැඩි ප්‍රමාණයක් භෞතිකව පවතින නමුත් ඒවාහි මුල් ස්වරූපයෙන් නැති බවත් සභාපති දැනුම් දී ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.89,190,543 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ලාභය රු.54,439,370 ක් වූයෙන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.34,751,173 කින් වැඩි වී තිබුණි. ඒ සඳහා දළ මෙහෙයුම් ආදායම රු.16,861,103 කින් වැඩි වීම හා ආදායම් බදු වියදම රු.6,342,116 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ අතිරික්තය රු 113,249,397 ක් වුවත් මෙහෙයම් කටයුතු වල ප්‍රතිඵලය රු 46,983,084 ක් ව අතර රු 66,266,313 ක් වෙනත් ආදායම් වේ. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අතිරික්තය රු.108,187,543 ක් වුවත්, මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.30,252,223 ක් වූ අතර, රු.77,935,320 ක් වෙනත් ආදායම් වේ. ඒ අනුව, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ශුද්ධ අතිරික්තය 55% කින් වැඩි වී ඇති අතර මුළු ශුද්ධ අතිරික්තය 64 % කින් වැඩි වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### (අ) 2011 ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක ලඟාකර ගැනීම

පහත සඳහන් රක්ෂණ ඔප්පු හා ඇපකර ප්‍රමාණයන් ඉලක්ක ගත සංඛ්‍යා කරා ළඟාවීමට නොහැකි වී තිබුණි.

| ඔප්පු හා ඇපකර වර්ගය | ක්‍රියාකාරි සැලැස්මට අනුව | | තථ්‍ය සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තුගත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | වටිනාකම |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | | | |
| | | රු.මිලියන | | % | රු.මිලියන |
| අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු | 42 | 1,104 | 32 | 76 | 1,213 |
| පශ්චාත් නැව්ගත කිරීමේ ඇප සහතික | 18 | 650 | 10 | 56 | 354.9 |
| ගුවන් ගමන් වියදම් ඇප සහතික | 2150 | 357 | 1452 | 68 | 180.9 |

සමාලෝචිත වර්ෂයේ දි පූර්ව නැවිගත කිරීමේ ඇප සහතික ක්‍රමය සහ අපනයන කාර්ය සාධන ඇප සහතික ක්‍රමය හැර අනෙකුත් ඔප්පු සහ ඇපකර නිකුත් කිරීමට අදාල වූ ඉලක්ක ගත සංඛ්‍යාවෙන් සම්පූර්ණ කරගෙන තිබූ ප්‍රමාණයන් 56% සිට 76% අතර පරාසයක විය.

**(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රක්ෂණ ඔප්පු හා ඇපකර අඩුවෙන් නිකුත් කිරීම**

| ඔප්පු හා ඇපකර වර්ගය | 2011 | | 2010 | | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | |
| | | රු. | | රු. | % |
| ගුවන් ගමන් වියදම් ඇප සහතික | 1452 | 180,906 | 2120 | 275,371 | 68 |

සමාලෝචිත වර්ෂයේදී ගුවන් ගමන් වියදම් ඇප සහතික ක්‍රමය හැර අනෙකුත් ඔප්පු සහ ඇපකර නිකුත් කිරීම් වැඩි වීමක් දක්නට ලැබුණි.

## 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 30 ට අනුව සංස්ථාව විසින් සේවක මණඩල නැවත බාණ්ඩ ගත කර ඒ අනුව වැටුප් සංශෝධනයක් සිදුකරගෙන නොතිබුණි.

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. අභ්‍යන්තර විගණන කටයුතු අනු කොන්ත්‍රාත් පදනම මත කර තිබුණි.

## 4.2 විගණන කමිටු

----------------

2003 ජුනි 02 පීඊඩී 12 චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාර අවම වශයෙන් මාස 3 කට වරක් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සංස්ථාව විසින් එසේ පවත්වා නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.4 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර 20% සිට 150% අතර විචලනයක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

----------------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අපනයන බිල් මත අත්තිකාරම් ආපසු අය කර ගැනීම.

(ආ) ක්‍රියාකාර සැලැස්ම අනුව ඉලක්ක ලඟා කර ගැනීම.

(ඇ) අතිරික්ත මුදල් ආයෝජනය කිරීම.